www.AlevelApi.com

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2018

## 41 - බුද්ධ ධර්මය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**I - පත්‍රය** - කාලය : පැය 02 යි

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්ණ 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

**II - පත්‍රය** - කාලය : පැය 03 යි

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් යුක්තය.

I කොටස - ව්‍යුහගත ප්‍රශ්න 03 කින් ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 05 කි. ප්‍රශ්න 03 කට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60 කි.

අවසාන ලකුණු ගණනය කිරීම : I පත්‍රය = 100
II පත්‍රය = 100

**අවසාන ලකුණු : 200 ÷ 2 = 100**



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................
........................................ √ △ $\frac{4}{5}$
........................................

(ii) ........................................
........................................ √ △ $\frac{3}{5}$
........................................

(iii) ........................................
........................................ √ △ $\frac{3}{5}$
........................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ ඇතුළත් කර අකුරෙන් ද ලියන්න. අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.06 / 0830 - 1030

බුද්ධ ධර්මය I
பௌத்தம் I
Buddhism I

41 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) යොදා දක්වන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** යි.

**1.** වරක් උපස්ථාන ශාලාවට රැස් වූ භික්ෂූන් වහන්සේලා අතර බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් ප්‍රකට වන ආශ්චර්යවත් ලක්ෂණ පිළිබඳ අතුරු කථාවක් උපන්නේ ය. එවිට ආනන්ද මාහිමියෝ "ඇවැත්නි, තථාගතවරු ආශ්චර්ය වෙතියි" පවසමින් බුදුරජාණන් වහන්සේගේ අනුදැනුම ද ඇතිව බුදු සිරිතෙන් ප්‍රකට වන ආශ්චර්යවත් කරුණු දහනවයක් වදාළහ. ඉන් එකක් නම්,

(1) බෝසතුන් මව් කුසෙන් බිහිවන විට ම මිනිසුන් විසින් පිළිගන්නා ලදී යන්නයි.
(2) උපන් විගස බෝසත් කුමරුන් නහවන ලද්දේ කිරි මව්වරුන් විසිනි යන්නයි.
(3) බෝසත් උපතින් සත්වන දා මව් දේවිය කලුරිය කළාය යන්නයි.
(4) උපන් වහා ම බෝධිසත්ත්වයන් වහන්සේ සබ්බ පාපස්ස අකරණං යනාදී ගාථාව ප්‍රකාශ කළහ යන්නයි.
(5) මව් දේවිය බෝසතුන් කුස දරා සිටියේ සත්මසක් පමණි යන්නයි.

**2.** බුදුරදුන් දහම් දෙසනුයේ ශ්‍රාවක සිත් ධර්මාවබෝධයට යෝග්‍ය වූ, මොලොක් වූ, නීවරණ ධර්මවලින් මිදුණු, ඔද වැඩුණු, ප්‍රසන්න තත්ත්වයට ගෙන ඒමෙන් පසුවයි. එබඳු ශ්‍රාවකයාට උන්වහන්සේ දාන කථා, සීල කථා ආදිය දේශනා කරති. ඉන් පසුව පවත්වන සාමුක්කංසික දේශනාවෙන් කියැවෙන්නේ උන්වහන්සේ,

(1) කෙලෙස් සහමුලින් නැති කිරීමට දහම් දෙසන බව ය.
(2) සාමූහිකත්වය අගය කරමින් අනුශාසනා පවත්වන බව ය.
(3) මෛත්‍රිය, කරුණාව ආදී බ්‍රහ්ම විහාර වැඩීමට උගන්වන බව ය.
(4) චතුරාර්ය සත්‍යය දේශනා කරන බව ය.
(5) සමානාත්මතාව ප්‍රගුණ කරවන බව ය.

**3.** බුදුරජාණන් වහන්සේ අෂ්ට විද්‍යා නම් වූ සුවිශේෂ ඥානාධිගමයන් අටකින් ද චරණ ධර්ම නම් වූ උතුම් පිළිවෙත් පසළොවකින් ද යුක්ත වෙති. එබැවින් විජ්ජා චරණ සම්පන්න ය. එම චරණ ධර්මවලට අයත් **නොවන** කරුණක් වන්නේ,

(1) තෘතීය ධ්‍යානයයි.
(2) පාපයෙහි ලැජ්ජාවීමයි.
(3) ජාගරියානු යෝගයයි.
(4) මනෝමය ඉද්ධි ඥානයයි.
(5) අහරෙහි පමණ දැනීමයි.

**4.** "ශාරිපුත්‍රය තවත් කරුණක් ඇත. තථාගත තෙමේ වෙනත් සත්ත්වයන්ගේ ශ්‍රද්ධාදි ඉන්ද්‍රිය වර්ධනය වීමත් පිරිහීමත් ඇති සැටියෙන් දනී. යම් ඥානයකින් උන්වහන්සේ එසේ අවබෝධ කරන්නේ ද එය එතුමන් ශ්‍රේෂ්ඨත්වයට පත් කරන දසවිධ ඥාන බලයෙන් එකකි." මහාසීහනාද සූත්‍රයේ එන මෙම ප්‍රකාශයෙන් හෙළිවන්නේ බුදුරජාණන් වහන්සේ,

(1) ඉන්ද්‍රිය ඥානයෙන් අගතැන්පත් වන බව ය.
(2) ඉන්ද්‍රිය පරෝපරියත්ති ඥානයෙන් යුක්ත වන බව ය.
(3) ඉන්ද්‍රිය ඥානය ඉක්මවා සිටින බව ය.
(4) පරචිත්ත විජානන ඥානය ඇති උතුමෙකු බව ය.
(5) මනෝමය සෘද්ධි ඥානයෙන් සමන්විත වන බව ය.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

5. බෝධිසත්ත්වයන් වහන්සේ කිං සච්ච ගවේසීව, කිං කුසල ගවේසීව, කාමාදී බැම්වලින් නිදහස් අනුත්තර වූ නිවන සොයා ඉමහත් වීර්යයෙන් බොහෝ කලක් දුෂ්කර ක්‍රියාදියෙහි නිරත වූ බව සඳහන් වේ. එම ගවේෂණශීලීත්වය හා වීර්යය ප්‍රකාශ කෙරෙන සූත්‍ර දේශනාවක් වන්නේ,
   (1) වීමංසක සූත්‍රයයි.  (2) කාලාම සූත්‍රයයි.  (3) සච්චවිභංග සූත්‍රයයි.
   (4) ධම්මචක්කප්පවත්තන සූත්‍රයයි.  (5) අරියපරියෙසන සූත්‍රයයි.

6. ධර්මරත්නයෙහි ගුණ කියැවෙන ස්වාක්ඛාතො යනාදි පාඨයෙහි එන **ඔපනයිකො** යන්නෙහි අර්ථය වන්නේ,
   (1) කෙලෙස් සහිත සත්ත්වයන්ට ධර්මය වටහා ගැනීම දුෂ්කර වේ යන්නයි.
   (2) මෙලොවදී ම දැන දැකගත හැකිය යන්නයි.
   (3) ශ්‍රවණය කරන්නාට පිං රැස්වේ යන්නයි.
   (4) නිවන් සුවය වෙත පමුණුවන යන්නයි.
   (5) උපමානුසාරයෙන් විස්තර කළ නොහැකිය යන්නයි.

7. නිත්‍ය ආත්මයක් නැත. සියල්ල මරණයෙන් කෙළවර වේ. එම මතය ම සත්‍යය ය. සෙසු මත අසත්‍ය යැයි වාද කළ චින්තකයෝ බුදුරදුන් දවස භාරතයෙහි විසූහ. එම මතවාදය සූත්‍ර දේශනාවලට අනුව හැඳින්විය හැක්කේ,
   (1) භව දිට්ඨි යනුවෙනි.  (2) සස්සත දිට්ඨි යනුවෙනි.
   (3) සයංකතවාද යනුවෙනි.  (4) උච්ඡේද දිට්ඨි යනුවෙනි.
   (5) නියතිවාද යනුවෙනි.

8. ලොව පහළ වූ ආගමික දර්ශනවාද අතර බුදුසමය ප්‍රකට කරන සුවිශේෂ ලක්ෂණයක් ලෙස හැඳින්විය හැක්කේ,
   (1) නවීන විද්‍යාව සමග කොහෙත්ම එකඟ නොවීම ය.
   (2) චින්තනයට හා වීමංසනයට දෙන නිදහස සීමා රහිත වීම ය.
   (3) බටහිර දර්ශනය හා හැමවිටම පරස්පර නොවීම ය.
   (4) සමකාලීන ආගමික අදහස් සියල්ල ප්‍රතික්ෂේප කිරීම ය.
   (5) තර්ක න්‍යායට සපුරා විරුද්ධ වීම ය.

9. බුද්ධ ධර්මය විවිධාකාරයෙන් උභයාර්ථ සාධනය උගන්වයි. ආත්මාර්ථ හා පරාර්ථ, මෙලොව හා පරලොව, අභ්‍යන්තර හා බාහිර ආදි වශයෙනි. එසේ උභයාර්ථය ම උගන්වා ඇති ධර්ම පාඨයක් නම්,
   (1) අත්තහිතාය පටිපන්නො හොති, යන්නයි.
   (2) අත්තදීපා භික්ඛවෙ විහරථ, යන්නයි.
   (3) ද්විචක්ඛුං පන සෙවෙථ, යන්නයි.
   (4) අත්තාහි අත්තනො නාථො, යන්නයි.
   (5) අත්ත දත්ථං පරත්ථෙන බහුනාපි නහාපයෙ, යන්නයි.

10. භික්ෂු සමාජයේ ප්‍රභවය හා විකාශය පිළිබඳ ව මෑත කාලීන පෙරා'පර දෙදිග පඬිවරුන් විසින් බොහෝ ශාස්ත්‍රීය අධ්‍යයන සිදු කොට තිබේ. එබඳු අධ්‍යයනවලදී පිළිගෙන ඇති කරුණක් නම්,
   (1) සිදුහත් බෝසතුන් මෙන් සමකාලීන මහණ බමුණෝ සත්‍ය ගවේෂී නොවූහ යන්නයි.
   (2) පිණ්ඩපාතයෙන් යැපුණේ බෞද්ධ පැවිද්දන් පමණක් නොවේ යන්නයි.
   (3) බ්‍රහ්මචාරී ජීවිතය වෙනත් පැවිද්දන් අතර දක්නට නොලැබිණි යන්නයි.
   (4) හිස මුඩු කිරීම බෞද්ධ පැවිද්දන්ට පමණක් අදාළ වේ යන්නයි.
   (5) වස්සාවාසය වෙනත් පැවිදි කොටස් අතර නොවී ය යන්නයි.

11. මහා සංඝයා වහන්සේගෙන් උපසම්පදාව ඉල්ලා සිටින සාමණේර භික්ෂූන් වහන්සේට නුසුදුසුකම් දහතුනක් ඇතැයි විනයේ සඳහන් වේ. විටින් විට උද්ගත වූ ගැටලු නිසා බුදුරදුන් අනුදැන වදාළ එකී අන්තරායකර ධර්ම අතර එකක් වන්නේ,
   (1) මව්පියන් මියගොස් තිබීම ය.
   (2) උපැවිදිව නැවත පැවිදි වූවෙකු වීම ය.
   (3) ධර්ම විනය නොදැනීම ය.
   (4) භික්ෂූන් භේද කළ අයකු වීම ය.
   (5) පැවිදි වීමට පෙර රාජ භටයකු වීම ය.

[තුන්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**12.** උපසම්පදාව ලත් භික්ෂුවට අදාළ ශික්ෂා ප්‍රඥප්ති දෙසිය විස්සක් භික්ෂු ප්‍රාතිමෝක්ෂයෙහි ඇතුළත් වේ. එහි එන මූලික ප්‍රඥප්ති සතර හැර අතිරේක ප්‍රඥප්ති කිසිවක් කඩකිරීමෙන් භික්ෂුත්වය අහිමි වන්නේ නැත. එම මූලික ප්‍රඥප්ති අතුරෙන් එකක් හැඳින්වෙන්නේ මනුස්සවිග්ගහ පරාජිකාව නමිනි. එය සිදුවන්නේ,
(1) මිනිසකු මැරීමට ආයුධ පිළියෙල කොට තැබීමෙනි.
(2) කුමන හෝ සතෙකුගේ දිවිතොර කිරීමෙනි.
(3) මිනිසෙකුට කායිකව හිංසා කිරීමෙනි.
(4) මරණානුස්සතිය වැඩීමෙනි.
(5) ප්‍රාණඝාත චේතනාව පහළවීමෙනි.

**13.** "සුපටිපන්නො භගවතො සාවක සංඝො" යනාදී සංඝරත්නයේ ගුණ කියැවෙන පාඨයෙහි 'අට්ඨපුරිස පුග්ගලා' යන්නෙන් ගිහි පැවිදි වෙනසක් නැතිව ශාසනයට ඇතුළත් ආර්ය පුද්ගලයන් අටදෙනකු ගැන කියැවෙයි. ඉන් එක් පුද්ගලයෙකු වන්නේ,
(1) දස ශීලය ආරක්ෂා කරන්නා ය.
(2) උපසම්පදාලාභී පැවිද්දා ය.
(3) තෙරුවන් සරණ ගිය උපාසකයා ය.
(4) නැවත කාම භවයක උපතක් නොලබන්නා ය.
(5) අචල ශ්‍රද්ධාව ඇති පැවිද්දා ය.

**14.** "අනුජානාමි භික්ඛවෙ වස්සානෙ වස්සං උපගන්තුං." (මහණෙනි වස්සාන සෘතුවේදී වස් විසීමට අනුදනිමි) යන බුද්ධ නියමය අනුව උපසම්පදා භික්ෂූන් වැසි සමය තුළ දායකාදීන්ගේ ඇරයුමක් ඇතත් නැතත් සුදුසු තැනෙක වස් එළඹ වැඩ සිටිය යුතු ය. එවිට, එම භික්ෂූන් වහන්සේට,
(1) කවර හේතුවක් නිසා හෝ වස් එළඹි තැනින් පිටතට යා නොහැකි ය.
(2) වස් එළඹි තැනින් පිට වී වාසය කළ හැක්කේ දින තුනක් පමණි.
(3) වස් එළඹි පසු සාමණේර භික්ෂූන් සමග එකම ආරාමයේ වාසය කළ නොහැකි ය.
(4) වස් කාලය තුළ චාරිකාවේ නිරත විය හැකි ය.
(5) වස් පවාරණයෙන් පසු කඨිනයක් ඇතිරීමට අවස්ථාව ලැබෙයි.

**15.** භික්ෂු සංඝයා විසින් භික්ෂු සංඝයාගේ ම යහපැවැත්ම, සමගිය සහ පාරිශුද්ධිය පිණිස අවශ්‍යතාව පරිදි පවත්වනු ලබන සංඝ සන්නිපාතය, විනය කර්මය නම් වේ. ඒ අතරට ගැනෙන උපසම්පදා කර්මය, පිළිබඳ විධිවිධාන ඇතුළත් වන්නේ,
(1) භික්ෂු ප්‍රාතිමෝක්ෂයේ ය.
(2) මහාවග්ගපාළියේ ය.
(3) සමන්තපාසාදිකාවේ ය.
(4) විනය විනිච්ඡයේ ය.
(5) පරිවාරපාළියේ ය.

**16.** ඛුද්දා, අනුඛුද්දා ශික්ෂා පද කවරේද යන ගැටලුව බුදුරජාණන් වහන්සේ ධරමාන අවධියේ පටන් ම පැවතිණ. නිශ්චිත විසඳුමක් නොමැතිව අද දක්වා ම පවත්නා එම ගැටලුවට අදාළ පහත සඳහන් කරුණු අතුරෙන් නිවැරදි වන්නේ,
(1) මාගේ ඇවෑමෙන් සංඝයා විසින් ඛුද්දා අනුඛුද්දා ශික්ෂා පද සමූහනය නොකළ යුතුයැයි බුදුරජාණන් වහන්සේ වදාළහ යන්නයි.
(2) එම ගැටලුව බුදුරදුන් විසින් ඨපනීය ගණයට ඇතුළත් කරන ලදි යන්නයි.
(3) එම ගැටලුව අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේ ද සඳහන් වේ යන්නයි.
(4) එම ගැටලුව ගැන තීරණයක් නොගැනීමට ප්‍රථම සංගීතියේදී භික්ෂූහු එකඟ වූහ යන්නයි.
(5) ඇතැම් භික්ෂූහු සතර පරාජිකාව ද ඛුද්දා අනුඛුද්දා ශික්ෂා යැයි කීහ යන්නයි.

**17.** භාරතීය ථෙරවාදී මහාසංගායනා පවත්වන ලද්දේ ශාසන භාරධාරී ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ගේ මූලිකත්වයෙනි. එම සංගායනාවන්හිදී සසුනෙහි යහපැවැත්ම ද ධර්ම විනයෙහි පාරිශුද්ධත්වය ද අරමුණු කොට විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබේ. ධර්ම විනයට ඇතුළත් විය හැකි දුර්මත වාරණය කිරීම සඳහා එම සංගායනාවලදී ගත් එක් පියවරක් වන්නේ,
(1) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ය.
(2) ධර්ම විනය විවිධ භාෂාවන්ට නැගීම ය.
(3) ධර්ම විනය මුඛ පරපුරෙන් පවත්වාගෙන යාමට විධිවිධාන සැළසීම ය.
(4) අඩමසකට වරක් පාමොක් උදෙසීම ය.
(5) භික්ෂු අධ්‍යාපනය වැඩි දියුණු කිරීම ය.

[හතරවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**18.** ධර්ම විනයෙහි චිරපැවැත්ම හා ආරක්ෂාව සඳහා නොකළ යුතු දේ නොකිරීමටත් කළ යුතු දේ කිරීමටත් බුදුරජාණන් වහන්සේ භික්ෂු භික්ෂුණීන්ට අනුශාසනා කළහ. එබඳු එක් අනුශාසනාවක් නම්,
(1) බුද්ධ භාෂිතය මිස ශ්‍රාවක භාෂිතය පිළිනොගැනීම ය.
(2) විනය නීති වෙනස් කිරීමට යෝජනා නොකිරීම ය.
(3) බුද්ධනීතියට මිස රාජනීතියට අවනත නොවීම ය.
(4) ගමින්ගම විහාරස්ථාන ඉදි කිරීම ය.
(5) නවාංග ශාස්තෘ ශාසනය ප්‍රගුණ කිරීම ය.

**19.** ස්වකීය ශ්‍රාවක භික්ෂූන්ගේ විවිධ හැකියා අගය කරමින් උන්වහන්සේලා දිරිමත් කිරීම පිණිසත්, සසුනෙහි යහපැවැත්ම පිණිසත් බුදුරදුන් විසින් අග්‍රතනතුරු පිරිනමන ලදි. එහිදී බහුශ්‍රැත භාවය හා වීර්යවන්ත භාවය මෙන් ම ස්මෘතිසම්පන්න භාවය ද උදෙසා එක ම ශ්‍රාවකයෙකුට අග්‍රස්ථාන ලැබිණි. උන්වහන්සේ නම්,
(1) බක්කුල මාහිමි ය. (2) ආනන්ද මහතෙරුන් වහන්සේ ය.
(3) සීවලී මහරහතන් වහන්සේ ය. (4) කුමාර කාශ්‍යප මාහිමි ය.
(5) රාහුල තෙරුන් වහන්සේ ය.

**20.** ප්‍රථම සංගීතිය අවසානයේ දී ධර්ම විනය, පිටක වශයෙන් බෙදූ අතර මුඛ පරපුරෙන් ඒ ඒ කොටස් පවත්වාගෙන යාමට වෙන වෙන ම ගුරු සිසු පරම්පරාවලට පවරන ලදි. එහිදී ඛුද්දක නිකාය,
(1) සැරියුත් මාහිමියන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට පවරන ලදි.
(2) අනුරුද්ධ මා හිමියන් ප්‍රමුඛ සඟ පරපුරට පවරන ලදි.
(3) කොණ්ඩඤ්ඤ මහතෙරුන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පරම්පරාවට පවරන ලදි.
(4) මහාකච්චාන මාහිමියන් ඇතුළු අනුගාමික භික්ෂූන්ට පවරන ලදි.
(5) ආචාර්ය පරපුරකට පැවරූ බවක් සඳහන් නොවේ.

**21.** තෙවන ධර්ම සංගීතියෙන් පසු රටවල් නවයකට ධර්ම දූත භික්ෂූන් යැවූ බව මහාවංශයේ සඳහන් වේ. එහි දී මජ්ඣිම තෙරණුවන් ප්‍රධානව කාස්සපගොත්ත, චුල්ලදේව, සහදේව, දුන්දුභිස්සර යන හිමිවරුන් වැඩම කළේ,
(1) කාශ්මීර-ගන්ධාරයට ය. (2) වනවාස දේශයට ය. (3) මහාරාෂ්ට්‍රයට ය.
(4) යෝනක දේශයට ය. (5) හිමවන්ත ප්‍රදේශයට ය.

**22.** භික්ෂු සමාජය යනු ගුරු-ශිෂ්‍ය සංවිධානයකි. විනයට අනුව ගුරුවරුන් හැඳින්වෙන්නේ ආචාර්යවරුන් හා උපාධ්‍යායවරුන් ලෙස ය. සිසුහු අන්තේවාසික සහ සද්ධිවිහාරික නම් වෙති. මෙකී දෙපක්ෂය අතර සම්බන්ධය නිසි ලෙස පවත්වාගෙන යාමට අදාළ සදුපදේශයන් ඇතුළත් වන්නේ,
(1) චරියාපිටකයේ ය. (2) මහාවග්ගපාළියේ ය.
(3) සමන්තපාසාදිකාවේ ය. (4) පරිවාර ග්‍රන්ථවල ය.
(5) පාචිත්තියපාළියේ ය.

**23.** බුදුරජාණන් වහන්සේගේ වඩාත් ම පැරණි දේශනා ඇතුළත් වන්නේ සූත්‍ර පිටකයේ ය. එම දේශනා සම්මුති දේශනා ලෙස ද හැඳින්වේ. සූත්‍ර පිටකය දීඝ නිකායාදී වශයෙන් ප්‍රභේද ගතවන අතර එහි සුත්ත නිපාතය අයත් වන්නේ,
(1) ඛුද්දක පාඨයටයි. (2) සංයුත්ත නිකායටයි.
(3) පෙටකොපදෙසයටයි. (4) ඛුද්දක නිකායටයි.
(5) අංගුත්තර නිකායටයි.

**24.** බුදුරජාණන් වහන්සේ විසින් ගිහි සමාජය සංවිධානය විය යුතු ආකාරයත් ඊට අදාළ විනයත් සවිස්තරව උගන්වා ඇත්තේ සිගාලෝවාද සූත්‍රයේ ය. ගිහි බෞද්ධයන් විසින් කළ යුතු දේ මෙන්ම නොකළ යුතු දේ ද කියැවෙන එම සූත්‍රය අයත් වන්නේ,
(1) දීඝ නිකායටයි. (2) අංගුත්තර නිකායටයි. (3) ඛුද්දක නිකායටයි.
(4) මජ්ඣිම නිකායටයි. (5) සංයුත්ත නිකායටයි.

**25.** ථෙරවාද අභිධර්මය, ධම්මසංගිණි ප්‍රකරණය ආදී සත් වැදැරුම් ප්‍රකරණයකින් යුක්ත වන අතර එය පරමාර්ථ දේශනාව ලෙස හැඳින්වේ. චිත්ත, චෛතසික, රූප, නිබ්බාන යන පරමාර්ථ ධර්මයෝ අභිධර්මයෙහි මූලික අවධානයට යොමුවී ඇත්තාහ. එහි සූවිසි ප්‍රත්‍ය විභාගය දක්නට ලැබෙන්නේ,
(1) නෙත්ති ප්‍රකරණයෙහි ය. (2) පට්ඨාන ප්‍රකරණයෙහි ය.
(3) විභංග ප්‍රකරණයෙහි ය. (4) යමක ප්‍රකරණයෙහි ය.
(5) කථාවත්ථුප්පකරණයෙහි ය.

[පස්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

**26.** බුද්ධ කාලීන භාරතයෙහි ආගමික දාර්ශනික අදහස් ප්‍රකාශ කළ චින්තකයෝ ශ්‍රමණ සහ බ්‍රාහ්මණ යනුවෙන් දෙයාකාර වූහ. එම චින්තකයන් පිළිබඳව කියැවෙන පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) බ්‍රාහ්මණ ඉගැන්වීම් වඩාත් පැරණි ය.
(2) ශ්‍රමණයෝ ද යාගහෝම පිළිගත්හ.
(3) බමුණන් ආත්ම දෘෂ්ටිය පිළිගෙන නැත.
(4) ආශ්‍රම ධර්ම ශ්‍රමණයන්ගේ ඉගැන්වීමකි.
(5) ශ්‍රමණයෝ මෙන්ම බ්‍රාහ්මණයෝ ද අකිරියවාදීහු ය.

**27.** "ලෝකය හා සත්ත්වයා මවා පාලනය කරන සර්ව බලධාරී ඊශ්වරයකු ඇත." යන්න බොහෝ සමය සම්ප්‍රදායවල මූලික ඉගැන්වීමකි. අනීශ්වරවාදී ධර්ම මාර්ගයක් වන බුදුදහමට අනුව,
(1) සියල්ල ඉබේ සිදු වේ.
(2) මැවුම්වාදය දසවස්තුක මිථ්‍යාදෘෂ්ටියට අයත් ය.
(3) ලෝකය ද සත්ත්වයා ද හේතු ප්‍රත්‍යයාකාරී ය.
(4) ලොව පාලනය කරන්නේ මහේශාක්‍ය දෙවිවරුන් විසිනි.
(5) දෙවිවරු කියා කිසිවෙක් නැත.

**28.** බුද්ධ කාලීන ශ්‍රමණ බ්‍රාහ්මණ චින්තකයන් ජීවිතය, ලෝකය හා මිනිස් හැසිරීම් අරබයා එකිනෙකට පරස්පර වූ විවිධ මතවාද ඉදිරිපත් කළ බව සාමඤ්ඤඵල සූත්‍රයෙන් පැහැදිලි වේ. මක්ඛලිගෝසාල ශ්‍රමණ සම්ප්‍රදායට අයත් එබඳු ශාස්තෘවරයෙකි. ඔහු පිළිබඳව පළකළ හැකි **වැරදි** අදහස නම් ඔහු,
(1) අහේතු අප්‍රත්‍යයවාදියෙකි යන්නයි.
(2) සංසාර ශුද්ධිවාදියෙකි යන්නයි.
(3) නියතිවාදියෙකි යන්නයි.
(4) සප්තකායවාදියෙකි යන්නයි.
(5) අකිරියවාදියෙකි යන්නයි.

**29.** අග්ගඤ්ඤ සූත්‍රය මිනිස් සමාජයේ පරිණාමය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හඳුනා ගැනීමට උපකාරී වන ප්‍රධානතම මූලාශ්‍රයයි. ආර්ථික, දේශපාලන, පාරිසරික, මානසික ආදී විවිධ පරිණාම සාධක හෙළිදරව් කරන එම සූත්‍රයෙහි 'සන්නිධිකාර පරිභෝගය' ලෙස දක්වා ඇත්තේ,
(1) මහජනයා එක්රැස්ව සාමූහික තීරණවලට එළඹීම ය.
(2) පාරිසරික සම්පත් තණ්හාවෙන් පරිභෝග කිරීම ය.
(3) ඇල් සහල් පොදුවේ ප්‍රයෝජනයට ගැනීම ය.
(4) ස්ත්‍රී පුරුෂ සම්භෝගය ඇතිවීම ය.
(5) සම්පත් රැස්කොටගෙන පෞද්ගලිකව භුක්ති විඳීම ය.

**30.** පුහුදුන් සත්ත්වයෝ පඤ්ච උපාදානස්කන්ධය පිළිබඳව "මගේය, මම වෙමි, මගේ ආත්මය වේ යැයි" විපරීත චින්තනයක ගිලී සිටිති. අස්මිමානය ලෙස ද හැඳින්වෙන 'මම වෙමි' යන චින්තනය උගුළුවාලනු පිණිස වැඩිය යුත්තේ,
(1) අනත්ත සංඥාවයි.
(2) මෛත්‍රී චින්තාවයි.
(3) බුද්ධානුස්සතියයි.
(4) අනිච්ච සංඥාවයි.
(5) ආනාපාන සතියයි.

**31.** පරිසරය මිනිසාට බලපායි. මිනිසා ද පරිසරයට බලපායි. මිනිසා සහ පරිසරය අතර ඇත්තේ සාපේක්ෂක බවකි. මෙම යථාර්ථය ප්‍රකට කරන බුදුදහම, අනිසි ලෙස පරිසරය පරිභෝග කිරීම නිසා මිනිසුන්ගේ ආයුවර්ණාදිය පිරිහුණු බව කියයි. එසේ ම එයින් පරිසර විනාශය ද සිදු වේ. ඒ බව ප්‍රකාශ වන බුද්ධ දේශනාව කුමක් ද?
(1) කූටදන්ත සූත්‍රය
(2) වනරොප සූත්‍රය
(3) අග්ගඤ්ඤ සූත්‍රය
(4) චක්කවත්තිසීහනාද සූත්‍රය
(5) අරියපරියෙසන සූත්‍රය

**32.** බුදුදහමෙහි ප්‍රධාන ඉගැන්වීමක් වන චතුරාර්ය සත්‍යය පිළිබඳ විවිධ පැහැදිලි කිරීම් සූත්‍රාන්තයන්හි නොයෙක් තැන දැකගත හැකි ය. එසේ දක්වා ඇති පැහැදිලි කිරීමක් නම්,
(1) චතුරාර්ය සත්‍යය අප තුළ ඇති දහමක් නොවේ යන්නයි.
(2) බුදුවරයකු නූපන්නේ නම් චතුරාර්ය සත්‍යය ද ලොව නූපදියි යන්නයි.
(3) චතුරාර්ය සත්‍යය සාමුක්කංසික දේශනාව නම් වේ යන්නයි.
(4) සියලු කුසල ධර්ම චතුරාර්ය සත්‍යයෙහි සංග්‍රහ කළ නොහැකි ය යන්නයි.
(5) පළමුවරට චතුරාර්ය සත්‍යාවබෝධය කරන ලද්දේ ගෞතම බුදුරජාණන් වහන්සේ විසිනි යන්නයි.

[හයවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**33.** "ඇවැත්නි! දුක්ඛාර්ය සත්‍යය නම් කවරේ ද? ඉපදීම ද දිරායාම ද මරණය ද ශෝකය ද වැළපීම ද කායික පීඩා ද මානසික වූ දොම්නස් ද උපායාස ද කැමති දේ නොලැබීම ද සැකෙවින් පඤ්ච උපාදානස්කන්ධය ද දුක නම් වේ." මෙම පැහැදිලි කිරීම තුළ **උපායාස** යන්නෙන් අදහස් වන්නේ,

(1) ළෙහි අත් ගසමින් වැළපීමයි.
(2) ප්‍රිය විප්‍රයෝග දුකයි.
(3) ජරාජීර්ණ බවින් ඇති වන අසහනයයි.
(4) කිසියම් ව්‍යසනයක් නිසා ඇති වන සිත් තැවුලයි.
(5) ධනෝපායනයට දරන උත්සාහය නිසා ඇති වන දුකයි.

**34.** භාෂාව යනු මනස ඇතුළු ඉන්ද්‍රිය මගින් අත්දකිනු ලබන දේවල් හා අදහස් ප්‍රකාශ කිරීම සඳහා මිනිසුන් වන අප විසින් නිපදවා ප්‍රයෝජනයට ගනු ලබන්නකි. නිවන වැනි අලෞකික අනුභූතියක් භාෂාව මගින් ප්‍රකාශ කළ හැකි ද? මේ පිළිබඳව නිවැරදි අදහසක් වන්නේ,

(1) නිවන කිසිසේත් ම භාෂාවට නැගිය නොහැකිය යන්නයි.
(2) සෝවාන් පුද්ගලයාට පමණක් නිවන විස්තර කළ හැකිය යන්නයි.
(3) බුදු දහමෙහි නිවන දක්වා ඇත්තේ නිෂේධාර්ථවත් වචන මගිනි යන්නයි.
(4) නිවනේ ස්වභාවය කිව හැක්කේ පාලි භාෂාවෙන් පමණකි යන්නයි.
(5) නිවන පැහැදිලි කිරීමට භාෂාව සපුරා ප්‍රමාණවත්ය යන්නයි.

**35.** සදාකාලික සැප ලැබීමට නම් හැකිතාක් දුක් විඳිය යුතු ය. තමා විසින් තමා ම තැවිය යුතු ය. එසේ දුක් විඳීමෙන් ම දුක් පීඩා ගෙවා දැමිය හැකි යැයි බුද්ධ කාලීන ඇතැම් සාමයික සම්ප්‍රදායවල ඉගැන්වූ බව සඳහන් වේ. මෙම අන්තවාදී ක්‍රියා පිළිවෙතට සපුරා එරෙහි වූයේ,

(1) ලෝකායතවාදයයි.
(2) අත්තන්තප යෝගයයි.
(3) සීලබ්බත පරාමාසයයි.
(4) නිත්‍යාත්මවාදයයි.
(5) කටුක ව්‍රත සමාදානයයි.

**36.** සියල්ල ඇත. නිත්‍ය වූ ආත්මයක පැවැත්ම යථාර්ථයකි. මේ ශාස්වත දෘෂ්ටියයි. සියල්ල නැත. නිත්‍යාත්මය මුසාවකි. මෙය අශාස්වත දෘෂ්ටියයි. බුද්ධ කාලීන සියලු දෘෂ්ටීන්ට පදනම වූ මෙම උභයාන්තයට ම නොපැමිණ බුදුරදුන් මධ්‍යම දේශනා නම් වූ පටිච්චසමුප්පාද දේශනාව පවත්වන බව සඳහන් වන්නේ,

(1) බ්‍රහ්මජාල සූත්‍රයේ ය.
(2) අග්ගිවච්ඡගොත්ත සූත්‍රයේ ය.
(3) සන්දක සූත්‍රයේ ය.
(4) කච්චානගොත්ත සූත්‍රයේ ය.
(5) සංගාරව සූත්‍රයේ ය.

**37.** ගෘහස්ථ ජීවිතයක් ගත කරන්නෙකු සිය කායික ශක්තිය මෙන් ම මානසික ශක්තිය ද උපකාර කොට ගෙන දෙලොව දියුණුව ඇති කර ගත යුතු යැයි බුදුරදුන් උගන්වා වදාළේ,

(1) ජානුස්සෝණි බ්‍රාහ්මණයාට ය.
(2) දීඝජානු කෝලිය පුත්‍රයාට ය.
(3) ජීවක වෛද්‍යවරයාට ය.
(4) යසකුල පුත්‍රයාට ය.
(5) චිත්ත ගෘහපතියාට ය.

**38.** සබ්බෙ සත්තා, සබ්බෙ පාණා, සබ්බෙ භූතා යන සංකල්පය බෞද්ධ ඉගැන්වීම් තුළ දක්නට ලැබෙන්නකි. එය සකල ජීව හිතවාදයක් ලෙස හැඳින්විය හැකි ය. ඒ සමග ම මිනිසා ශ්‍රේෂ්ඨ යැයි ද බුදු දහමෙහි පිළිගෙන ඇත. ඒ බව සනාථ වන්නේ,

(1) කුසලාකුසල ධර්ම පිළිබඳ දේශනාව තුළිනි.
(2) බ්‍රහ්මවිහාර ඉගැන්වූ අවස්ථාවෙනි.
(3) සිවු සඟරාවත්වලිනි.
(4) බෞද්ධ ශීල ශික්ෂාවෙනි.
(5) බෝධිසත්ත්වයකු වීමේ යෝග්‍යතා දැක්වූ අවස්ථාවෙනි.

**39.** බුද්ධ කාලීන භාරතීය මහණ බමුණන් අතර දිගු කලෙක පටන් ධ්‍යාන, භාවනා සහ තදනුබද්ධ ප්‍රතිඵල පිළිබඳ දැනුවත්කමක් පැවති බව සූත්‍ර දේශනාවලින් හෙළිවෙයි. එහි ලා බුදුසමය තැබූ ඉදිරි පියවර වන්නේ,

(1) ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමට ඉගැන්වීමයි.
(2) අනුන්ගේ සිත්හසර දැන දැකගැන්මට ඉගැන්වීමයි.
(3) ආසවක්ඛය ඤාණය තුළින් ලබන විමුක්තිය පෙන්වා දීමයි.
(4) චතුර්ථ ධ්‍යානය ඉපදවීමට මග හෙළි කිරීමයි.
(5) නෙවසඤ්ඤානාසඤ්ඤායතනය ඉගැන්වීමයි.

[හත්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**40.** කර්මය හා විපාකය පිළිබඳව සමාජය තුළ නිසි අවබෝධයක් නැති බවත්, ඒ පිළිබඳව විවිධ ආකල්ප ප්‍රචලිතව ඇති බවත් විද්වත්හු පෙන්වා දෙති. ඒ අතර නිවැරදි ආකල්පයක් වන්නේ,
(1) කර්මය වෙනස් කළ නොහැකිය යන්නයි.
(2) කුසල් සසරට ද පිං නිවනට ද හේතුවේ යන්නයි.
(3) පෙර කළ කර්ම සියල්ල දුක් උපදවයි යන්නයි.
(4) මිනිසුන් උස් පහත් වන්නේ කර්මානුරූපව පමණි යන්නයි.
(5) "හෙතෙම කරයි හෙතෙම විඳියි." යන්න අබෞද්ධ මතවාදයකි යන්නයි.

**41.** බුදුදහම අනුව මෙලොව දියුණුව මෙන් ම පරලොව දියුණුව ද ළඟා කර ගැනීමට නම් වීර්යය වැඩිය යුතු ය. අධිෂ්ඨානශීලී විය යුතු ය. අප බෝසතාණන් වහන්සේ අධිෂ්ඨානය මෙන් ම වීර්යය ද පිළිබඳව ආදර්ශය ලබා දී ඇති කථා පුවතක් නම්,
(1) මට්ටකුණ්ඩලී වස්තුවයි.
(2) දහම්සොඬ කථාවයි.
(3) බෝධිරාජකුමාර වස්තුවයි.
(4) වණ්ණුපථ ජාතකයයි.
(5) නාලාගිරි දමනයයි.

**42.** මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට පළමුවෙන් පැවැත්වූ ධර්ම දේශනාව ලෙස වාර්තා වන්නේ මැදුම් සඟිය මූලපණ්ණාසකයේ එන චූළහත්ථිපදෝපම සූත්‍රයයි. ඇත්පිය උපමාව මුල්කොට ගත් එම සූත්‍රයෙන් කියැවෙන්නේ ත්‍රිවිධ රත්නය අරබයා බෞද්ධයකු තුළ ඇති කර ගත යුතු,
(1) අමූලිකා ශ්‍රද්ධාවයි.
(2) අචල විශ්වාසයයි.
(3) ආකාරවතී ශ්‍රද්ධාවයි.
(4) ප්‍රසාද මාත්‍රයයි.
(5) භක්ති ප්‍රේමයයි.

**43.** නිති පන්සිල් රකිමින් දැහැමි සාමකාමී ජීවිතයක් ගත කිරීම ද පොහොය අටසිල් රකිමින් නිර්වාණගාමී ප්‍රතිපදාවේ හැසිරීම ද ගිහි බෞද්ධයෙකුගෙන් අපේක්ෂා කෙරේ. එසේම ගිහි දස ශීලයක් ද ඇත. එහි සුවිශේෂත්වය නම්,
(1) බ්‍රහ්මචාරීව විසීම ය.
(2) පස්පවින් වැළකීම ය.
(3) මිල මුදල් පරිහරණය නොකිරීම ය.
(4) සුවපහසු අසුන් භාවිත නොකිරීම ය.
(5) මිථ්‍යා ආජීවයෙන් වැළකීම ය.

**44.** බුදුරජාණන් වහන්සේ වෛද්‍යවරයකුට සමාන යැයි ධර්මයේ සඳහන් වේ. වෛද්‍යවරු රෝගීන්ට අගුණ දේ කියා දෙති. බුදුවරු ද සසර දුකට පත්ව සිටින්නන් නොකළ යුතු පව් හා අකුසල් කියා දෙති. වෛද්‍යවරු රෝගීන්ට ගුණදායක දේ උගන්වති. බුදුරජාණන් වහන්සේ ද පිං හා කුසල් උගන්වති. එබඳු කුසල ධර්මයෙක ලක්ෂණයක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) සසර දික්වීම ය.
(2) අකුසල් මුල් යටපත් වීම ය.
(3) විවිධ සම්පත් ලැබීම ය.
(4) කාම ලෝකවල උපත ලැබීම ය.
(5) උපනුපන් ජාති දිගාසිරි ලැබීම ය.

**45.** සිවුබඹ විහරණයන්හි මුලට කියැවෙන මෙත්තාව අප විසින් සියලු සත්ත්වයන් වෙත පැතිර විය යුත්තකි. එසේ මෙත් වඩන තැනැත්තාට අනුසස් එකොළහක් ලැබෙයි. ඉන් එකක් නම්,
(1) ගැඹුරු නුවණක් ලැබීම ය.
(2) නුමුළාව මියයාම ය.
(3) බොහෝ සම්පත් ලැබීම ය.
(4) සොරසතුරු උවදුරු නැති වීම ය.
(5) දීර්ඝායුෂ ලැබීම ය.

**46.** එක්තරා සමාගමක වගකීම දැරූ අංශ ප්‍රධානියෙක් විය. එම තනතුර වසර තුනකට සීමා වෙයි. එම කාලය නිම කළ එකී නිලධාරියා නැවත සාමාන්‍ය සේවකයකු වූ අතර පහළින් සිටි සේවකයෙක් ඔහුගේ අංශ ප්‍රධානියා විය. ඒ ගැන මුලින් තනතුර දැරූ තැනැත්තා බෙහෙවින් සතුටු විය. එම ගුණය හැඳින්විය හැක්කේ,
(1) මෛත්‍රී චින්තාව යනුවෙනි.
(2) සමානාත්මතා ගුණය යනුවෙනි.
(3) උපේක්ෂාව යනුවෙනි.
(4) මුදිතා ගුණය යනුවෙනි.
(5) කාරුණික බව යනුවෙනි.

**47.** අංගුත්තර නිකාය අනණ සූත්‍රය මෙලොව වශයෙන් ම ගිහියෙකුට විඳිය හැකි සැප සතරක් උගන්වයි. එම සැප විඳීමට නම් සුරක්ෂිත ආර්ථිකයක් ගොඩනගා ගත යුතු ය. එම සූත්‍රයේ භෝග සුඛ යන්නෙන් කියැවෙන්නේ,
(1) දැහැමිව භෝග සපයා ගැනීමෙන් ලබන සැපයයි.
(2) භෝග සම්පත් නිසි ලෙස පරිභෝග කිරීමේ සැපයයි.
(3) අය-වැය සමව පවත්වා ගැනීමෙන් විඳින සැපයයි.
(4) ණය නොවීමෙන් ලබන සැපයයි.
(5) තමාට ප්‍රමාණවත් භෝග සම්පත් ඇතැයි ලබන තෘප්තියයි.

[අටවැනි පිටුව බලන්න.

Aeve උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**48.** බුද්ධ දේශනාවන්හි නොයෙක් තැන ගිහි බෞද්ධයකු විසින් ධනය ඉපැයිය යුතු ආකාරය පිළිබඳ සදුපදේශයන් ලබා දී තිබේ. ඒ අතර දැහැමිව ධනය ඉපැයිය යුතු බව කියැවෙන ධර්ම පාඨයක් වන්නේ,
(1) විරියෙන දුක්ඛං අච්චෙති, යන්නයි.
(2) දාළිද්දියං හික්ඛවෙ දුක්ඛං ලෝකස්මිං, යන්නයි.
(3) උට්ඨාතා වින්දතෙ ධනං, යන්නයි.
(4) ද්වීහි කම්මං පයොජයෙ, යන්නයි.
(5) භමරස්සෙව ඉරීයතො, යන්නයි.

**49.** දික් සඟියේ කූටදන්ත සූත්‍රය වෘත්තාන්ත ශෛලියෙන් කළ දේශනාවකි. රාජ්‍ය පාලකයකු විසින් ප්‍රජාව ආර්ථික වශයෙන් සමෘද්ධිමත් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග තුනක් එහි ඇතුළත් වේ. ඉන් එකක් නම්,
(1) නිසි ලෙස බදු මුදල් අයකොට සංවර්ධන කටයුතු ඉටු කිරීම ය.
(2) සුදුස්සන්ට රැකියා ලබා දී සේවයට සරිලන වැටුප් ගෙවීම ය.
(3) දිළිඳුකම නැති කිරීම සඳහා ධනය බෙදා දීම ය.
(4) උපයන ධනයෙන් කොටසක් ඉතිරි කිරීමට පෙළඹවීම ය.
(5) ආර්ථික සමෘද්ධියට හානිදායක නීති නොපැනවීම ය.

**50.** රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අතර දස සක්විතිවත් වැදගත් තැනක් ගනියි. එහි ඇතුළත් එක් රාජ්‍ය පාලන මූලධර්මයක් වන්නේ,
(1) පැන වූ නීති නොකැඩීම ය.
(2) සමානාත්මතාවෙන් ක්‍රියා කිරීම ය.
(3) කුල ස්ත්‍රීන් ආරක්ෂා කිරීම ය.
(4) අධාර්මික ක්‍රියා වැළැක්වීම ය.
(5) ගොවි ජනතාවට අනුග්‍රහ දැක්වීම ය.

***

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

www.AlevelApi.com



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2018

| විෂය අංකය<br>பாட இலக்கம் | 41 | විෂයය<br>பாடம் | බුද්ධ ධර්මය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 5 | 21. | 5 | 31. | 3 | 41. | 4 |
| 02. | 4 | 12. | 1 | 22. | 2 | 32. | 3 | 42. | 3 |
| 03. | 4 | 13. | 4 | 23. | 4 | 33. | 4 | 43. | 3 |
| 04. | 2 | 14. | 5 | 24. | 1 | 34. | 3 | 44. | 2 |
| 05. | 5 | 15. | 2 | 25. | 2 | 35. | 1 | 45. | 2 |
| 06. | 4 | 16. | 4 | 26. | 1 | 36. | 4 | 46. | 4 |
| 07. | 4 | 17. | 3 | 27. | 3 | 37. | 2 | 47. | 2 |
| 08. | 3 | 18. | 5 | 28. | 4 | 38. | 5 | 48. | 5 |
| 09. | 3 | 19. | 2 | 29. | 5 | 39. | 3 | 49. | 2 |
| 10. | 2 | 20. | 5 | 30. | 4 | 40. | 5 | 50. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## <u>II පත්‍රය</u>

## <u>I කොටස</u>

01.

**(i) ' කිං සච්ච ගවේසී ' යන්න නිර්වචනය කරන්න.**

සත්‍යය කුමක්දැයි සොයායාම, සත්‍ය ගවේෂණය කිරීම මින් අදහස් වන බව, බුද්ධ කාලීනව සත්‍ය ගවේෂී චින්තකයන් බහුල වූ බව, සිදුහත් බෝසතාණන් ද එසේ ක්‍රියා කල බව.

**(ii) ' තථාගත සමන්නෙසනා ' යන්න පැහැදිලි කරන්න.**

තථාගතයන් වහන්සේගේ කාය, වාග් සමාචරයන් විමසීමට ශ්‍රාවකයාට අවසර ඇති බව, එසේ විමසීම මින් අදහස් වන බව, වීමංසක සූත්‍රයේ මෙය කියවෙන බව.

**(iii) ' බුදුදහම විශ්ව සාධාරණ ය. ' සාකච්ඡා කරන්න.**

බෞද්ධ මූලධර්ම සැමෙකක්ම දේශය කාලය කුමක් වුවද ලොවටම සාධාරණ වන බව, එබැවින් විශ්ව සාධාරණ වීම.

**(iv) ' බුදුවරු දෙලොව දියුණුවට උපදෙස් දෙති. ' විස්තර කරන්න.**

බුදුරදුන් මෙලොව මෙන්ම පරලොව දියුණුවට ගිහි ප්‍රජාවට උපදෙස් දෙන බව, නි.සු. ව්‍යාග්ගපජ්ජ, මහා මංගල ආදී සූත්‍ර.

**(v) ' බුදුරදහු උච්ඡේදවාදියෙක් නොවෙති. ' විමසන්න.**

බුදුරදුන් පරලොවක් නොපිළිගන්නා උච්ඡේදවාදියෙකු නොවන බව, උන්වහන්සේ සියල්ල මරණයෙන් කෙළවර වේයැයි උගන්වා නැති බව.

*(ලකුණු 20 යි)*

02.

**(i) ප්‍රාග් බෞද්ධ පැවිද්දේ ලක්ෂණ <u>හතරක්</u> නම් කරන්න.**

පැවිද්දන් විවිධ දෘෂ්ටිවාදවල එල්බ සිටීම, විවිධ පිළිවෙත් අනුගමනය කිරීම, ආජීවක ජටිලාදි ගුරුකුලවලට ඇතුළත් වීම, දන් පිළිගැනීම, බොහෝ ශ්‍රාවක පිරිස් ඇති බව යනාදී කරුණුවලින් හතරක් නම් කිරීම.

**(ii) බෞද්ධ පැවිද්දේ විශේෂතා හඳුන්වා දෙන්න.**

ශාස්වත උච්ඡේද ආදී අන්තවාදවලට හෝ ඒවාට අනුගත අත්තකිලමතානුයෝග කාමසුඛල්ලිකානු යෝග ආදී අන්තවලටද නොවැටීම, මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීම, පිරිසිදු බඹසර සුරැකීම ආදී විශේෂතා.

**(iii) ' ඤත්තිචතුත්ථකම්ම ' උපසම්පදාව පැහැදිලි කරන්න.**

උපසම්පදාව අපේක්ෂා කරන භික්ෂුව පිළිබඳ යෝජනාව නිසිපරිදි ගනපූරණය සහිතව රැස්වූ උපසම්පදා භික්ෂූන්ගේ සභාවකට තෙවරක් ඉදිරිපත් කොට විරෝධතා විමසා ඒවා නැති කල්හි ඔහු උපසපන් භික්ෂුවක ලෙස පිළිගැනීම මින් අදහස්වන බව විස්තර කිරීම.



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

**(iv) ' ආසවට්ඨානීය ධර්ම ' විස්තර කරන්න.**

විනය නීති පැනවීමට තුඩුදුන් හේතු ලෙස පාරජික පාළිය, භද්දාලි සූත්‍රාදියේ දැක්වෙන ලාභග්ග මහත්තතාදී කරුණු ආසවට්ඨානිය ධර්ම ලෙස සැළකෙන බව, ඉහත කී මූලාශ්‍රය දෙකින් එකක් විස්තර කිරීම ප්‍රමාණවත්ය.

**(v) ' පැවිදි ගුරු - සිසුන් පිය - පුතුන් සේ විසිය යුතු ය. ' විමසන්න.**

ආචාර්යවරයා ශිෂ්‍යයා පිළිබඳව මොහු මගේ පුත්‍රයාය යන හැඟීමෙන් ද ශිෂ්‍යයා ආචාර්යවරයා පිළිබඳව මේ මගේ පියාය යන හැඟීමෙන් ද ක්‍රියා කළ යුතු යැයි මහාවග්ග පාළි වත්තක්ඛන්ධකයේ සඳහන් වන බව, ඒ සඳහා ආචාර්ය, උපජ්ඣාය, අන්තේවාසික, සද්ධිවිහාරික වත් පනවා ඇති බව විමසීම.

*(ලකුණු 20 යි)*

03.

**(i) සංගායනාවලට මග පෙන්වූ බුද්ධ දේශනා දෙකක් නම් කරන්න.**

දී.නි. පාසාදික සූත්‍රය, දසුත්තර සූත්‍රය, සංගීති සූත්‍රය, සාමගාම සූත්‍රය ආදී සංගායනාවලට මග පෙන්වූ දේශනාවලින් දෙකක් නම් කිරීම.

**(ii) ප්‍රථම සංගීතිය පිළිබඳ තොරතුරු ඇතුළත් මූලාශ්‍රය හඳුන්වන්න.**

විනය පිටකය චුල්ලවග්ගපාළිය, සමන්තපාසාදිකාව, දීපවංශය, දුල්වා නම් ටිබෙට් ග්‍රන්ථය ආදී මූලාශ්‍රය අතුරින් දෙකක්වත් හඳුන්වා දීම.

**(iii) ප්‍රථම සංගීතියේ ආසන්න හේතු මොනවාද ?**

සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනය, ප්‍රථම සංගීතියට ආසන්න හේතුව වූ බව, බුදුරදුන් පිරිනිවි මෙහොතෙහි සුභද්‍ර එම ප්‍රකාශය කිරීම හා මහාකාශ්‍යප ආදී හිමිවරුන් ඒ පිළිබඳ දැරූ අදහස් ආදී තොරතුරු

**(iv) ධර්ම විනය යන්නෙහි අර්ථ විභාග කරන්න.**

බුද්ධ වචනය පිළිබඳ පැරණිම ප්‍රභේදය මින් අදහස් වන බව - "ධම්මොච විනයොච" ධර්ම යන්නෙන් සූත්‍ර හෙවත් සම්මුති දේශනාද විනය යන්නෙන් ප්‍රඥප්ති හෙවත් ආනා දේශනාද සැළකෙන බව.

**(v) ධර්ම විනයෙහි චිර පැවැත්මට ප්‍රථම සංගීතිය උපකාරී වූ අන්දම සාකච්ඡා කරන්න.**

ප්‍රථම සංගීතිය අවසානයේදී ධර්ම විනය කොටස්වලට වෙන්කොට ගොනු වශයෙන් සැකසීම, ධර්මය දීඝ නිකායාදිය වශයෙන් ද විනය පාරාජික පාළිය ආදිය වශයෙන් ද වෙන් කිරීම, ඒ ඒ ධර්ම විනය කොටස්වලට අදාළ භාණක පරම්පරා පත්කිරීම ආදී පියවර.

*(ලකුණු 20 යි)*



www.alevelapi.com
උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

## II කොටස

04.

**(i) සංජයබෙල්ලට්ඨිපුත්තගේ ඉගැන්වීම් විස්තර කරන්න.**

සංජය අමරාවික්ඛෙපවාදියෙකු බවත්, සංශයවාදියකු හා අඥේයවාදියකු වන බවත්, ඔහු එක එල්ලේ ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරක් නොදුන් බවත්, මහජනයා වික්ෂිප්ත බවට පත්කළ බවත් පැහැදිලි කිරීම. පංච නිශේධන ක්‍රමය අනුගමනය කිරීම වැනි කරුණු.

**(ii) එම ඉගැන්වීම් පිළිබඳ බෞද්ධ විචාරය පෙන්වා දෙන්න.**

එම ඉගැන්වීම් බුදුදහම කිසිසේත්ම නොපිළිගන්නා බව, එබඳු මතවාදයන් දරන්නේ හේතු හතරක් නිසායැයි දහමෙහි පෙන්වා දී ඇති බව, මොහු බෙහෙවින්ම සමාජයට හානිදායක ශාස්තෘවරයෙකු වන බව. (මුසාවාදභයා, උපාදානභයා, අනුයොගභයා මන්දා මොමුහත්තා)

*(ලකුණු 20 යි)*

05.

**(i) සසර දුක පිළිබඳ බුද්ධකාලීන මතවාද විස්තර කරන්න.**

සයං කතං දුක්ඛං, පරං කතං දුක්ඛං, සයං කතං ච පරං කතං ච දුක්ඛං, අසයංකාරං අපරංකාරං අධිච්චසමුප්පන්නං සුඛ දුක්ඛං, ශාස්වත ආශාස්වත යන උභයාන්තයටම වැටෙන සං.නි. අචෙලකස්සප සූත්‍රයේ දැක්වෙන ඉහත කී මතවාද විස්තර කිරීම.

**(ii) ' දුක්ඛෙ ලොකො පතිට්ඨිතො. ' විමසන්න.**

ලෝකය දුක මත පිහිටියේය. මෙහි ලෝකය යනු පඤ්චස්කන්ධයයි. සෑම ස්කන්ධයක්ම අනිත්‍යය. එබැවින් දුක් සහිතය. ස්කන්ධ පටිපාටිය හෙවත් සාංසාරික පැවැත්ම සපුරා දුක් සහිත යැයි මින් කියවෙන බව.

*(ලකුණු 20 යි)*

06.

**(i) කුසලාකුසල කර්ම නිශ්චය කිරීමේ බෞද්ධ මිනුම්දඬු පෙන්වා දෙන්න.**

කුසලාකුසල කර්ම නිශ්චය කිරීමේදී බුදුසමය තුළ නොයෙකුත් මිණුම්දඬු දක්වා ඇති බව, ඒ සියලු මිණුම් දඬු චේතනාව අනුව නිශ්චය කිරීම හා විපාකය අනුව නිශ්චය කිරීම යැයි දෙයාකාර වන බව.

**(ii) ' කර්මය නියතියක් නොවේ. ' ධර්මානුකූලව විමසන්න.**

බෞද්ධ කර්මවාදය නියති වාදයක් නොවේ. නියාම ධර්ම දේශනාව අනුවත්, ගිරිමානන්ද සූත්‍රයේ එන රෝග හේතු අට අනුවත් සියල්ල කර්මානුරූපව සිද්ධ නොවේ. පූර්ව කර්ම වාදය ද බුදුසමය පසෙකින් තබයි.

*(ලකුණු 20 යි)*



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

07.

**(i) සිවුබඹ විහරණ විස්තර කරන්න.**

මෙත්තා - සියලු සත්වයන්ගේ සුවසෙත යහපත කැමතිවීම, මිතුරු සිත.

කරුණා - දුකට පත් සත්ත්වයන්ට සානුකම්පිත වීම, පිහිට වීම.

මුදිතා - අනුන්ගේ සැපතට ඊර්ෂ්‍යා නොකිරීම, ඒ ගැන සතුටු වීම.

උපේක්ෂා - විවිධ විසම සමාජය තුළ මැදිහත්ව සිතීම හා ක්‍රියා කිරීම යන කරුණු විස්තර කිරීම.

**(ii) බෞද්ධ සාරධර්මවල කේන්ද්‍රය බ්‍රහ්මවිහාර බව පැහැදිලි කරන්න.**

සියලු බෞද්ධ සාරධර්මවල කේන්ද්‍රය සිවුබඹ විහරණයි. එකී බඹවිහරණවලින් තොර චරිතයක් දරන තැනැත්තා තුළ දානාදී සංග්‍රහ වස්තු ඇතැයි කියා හෝ සීලාදි ගුණධර්ම ඇතැයි කියා හෝ කිව නොහැකි බව.

*(ලකුණු 20 යි)*

08.

**(i) ' ප්‍රජා ආර්ථිකයේ පිරිහීම, සදාචාරය ද සාමය ද බිඳ වැටීමට හේතු වේ. ' සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න.**

දී.නි. චක්කවත්තිසීහනාද, කූටදන්ත, අං.නි. අධම්මික ආදී සූත්‍රවලට අනුව අකාර්යක්ෂම රාජ්‍ය පාලනය නිසා ප්‍රජා ආර්ථිකය බිඳ වැටෙයි. එයින් අදත්තාදාන, ප්‍රාණඝාතාදී දුසිරිත්වලට මිනිස්සු යොමු වෙත. නීතිය, සාමය බිඳවැටෙයි. මෙම කරුණු පැහැදිලි කිරීම.

**(ii) එම සමාජ අර්බුදයට රජය කෙසේ ප්‍රතිචාර දැක්විය යුතු දැයි බුද්ධානුශාසනය ඇසුරෙන් පරීක්ෂා කරන්න.**

ඉහත කී ආකාරයේ සමාජ අර්බුදයක් ඇති වූ විට එය වැළැක්වීමට රජය ධනය බෙදා දීම හෝ අවියෙන් පිළිතුරු දීම නොකළ යුතු බව, එබඳු රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාමාර්ග තවත් අර්බුදවලට මුල්වන අයුරු බුදුසමය පෙන්වා දෙන බව, කූටදන්ත සූත්‍රාදියට අනුව රජය ජනතාවගේ ආර්ථිකය ගොඩනැගීමට අනුග්‍රහ දක්වමින් ඔවුන් දුසිරිතෙන් මුදා නීතිය හා සාමය සුරක්ෂිත කළ යුතු බව.

*(ලකුණු 20 යි)*

www.alevelapi.com



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .